**ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2020**

---

ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 නොවැම්බර් 06 දින එළඹි අංක 5685 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II උපලේඛනයේ II ඡේදයේ (ඇ) (3) හා 2010 ජූලි 31 දින එළඹි ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රදාන සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තෝරාගත් දිස්ත්‍රික්කවල නල ජල සේවා සහ වැඩිදියුණු කළ සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩිකිරීම හා සම්බන්ධිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. නාගරික, ග්‍රාමීය හා වතු ජල සැපයුම් හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම පුනුරුත්ථාපනය කිරීම හා පුළුල් කිරීම, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ධාරිතාවය ශක්තිමත් කිරීම, පුහුණුව ලබාදීම මඟින් ආංශික ධාරිතාවය වර්ධනය කිරීම හා ජලයේ ගුණත්වය සැලසුම් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය හා පරිපාලනය යන සංරචක 04 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,590 කට සමාන වූ එජඩො මිලියන 183.90 ක් වන අතර ඉන් රු.මිලියන 24,750 කට සමාන එජඩො මිලියන 165 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි වූ මුදල රු. මිලියන 2,840 ශ්‍රී ලංකා රජය හා ප්‍රජා දායකත්වය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2015 දෙසැම්බර් 07 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2022 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ වගුව 2 හි විස්තර වන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ------------------------ | ------- | ---------------------------- | ------------------------- |
| | | රු. මිලියන | | |
| (අ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ ඡේද අංක 38 ප්‍රකාරව ග්‍රාමීය හා වතු ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා රු. මිලියන 189.87 ක් හා ග්‍රාමීය ජල සම්පාදන පුනරුත්ථාපන යෝජනා ක්‍රම සඳහා රු. මිලියන 250.6 ක නිම කරන ලද ව්‍යාපෘති වැඩ වල ප්‍රජා දායකත්වය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. එබැවින් ප්‍රජා දායකත්ව ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ රු. මිලියන 404.44 කින් අවප්‍රමාණය වී තිබුණි. | 440.47 | අවසන් ගෙවීම සිදු කිරීමෙන් සහ සම්පූර්ණයෙන්ම නිම කිරීමකින් තොරව ව්‍යාපෘති ප්‍රජා දායකත්වය වාර්තා කරනු නොලැබේ. | අවසන් කරන ලද ව්‍යාපෘතිය සඳහා ප්‍රජා දායකත්වය හඳුනාගත යුතු වීම. |
| (ආ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවන් අනුව, එජඩො මිලියන 116 කට සමාන රු. මිලියන 21,623 ක් 2020 දෙසැම්බර් 31 දිනට ණය නියෝජිත ආයතනය විසින් ලබා දි තිබුණි. කෙසේ වෙතත් අනුරූප වටිනා කම ලෙස රු. මිලියන 19,179 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. ඒ හේතුවෙන් ණය ලැබීම් මූල්‍ය ප්‍රකාශන වල අවප්‍රමාණය වි තිබුණි. | 2,444 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් බැර වූ දින අනුපාත අනුව අදාල අනුපාතය ගෙන ඇත. | ණය ශේෂය නිවැරදි කිරීමට පියවර ගත යුතු වීම. |
| (ඇ) | කිලිනොච්චි, මොණරාගල සහ මුලතිව් දිස්ත්‍රික්කයන් හි සමාලෝචිත වර්ෂය අවසානයට නිම කළ වැසිකිලි වල පිරිවැය රු. මිලියන 245.58 ක් විය. කෙසේ වෙතත් 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 218.86 ක් පමණක් ප්‍රාග්ධනිත ගතකොට තිබුණි. ඒ හේතුවෙන් ජල සම්පාදන හා | 26.72 | අවසන් ගෙවීම් සඳහා ප්‍රාග්ධනිත කිරිම් ලෙස රු.මිලියන 218.86 ක් අපි ප්‍රාග්ධනිත කොට ඇත්තෙමු. රු.මිලියන 26.72 ක ශේෂය සංවර්ධන පිරිවැයෙහි කෙරීගෙන | නිමකරන ලද වැසිකිලි වල වටිනාකම ප්‍රාග්ධනිත කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | සනීපාරක්ෂක යටිතල පහසුකම් වල සංවර්ධන පිරිවැය මූල්‍ය ප්‍රකාශන තුළ රු. මිලියන 26.72 කින් අවප්‍රමාණය වී තිබුණි. | | යන වැඩ යටතේ දක්වා ඇත. | |
| (ඇ) | මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩුඉරිප්පු ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාලව රු. මිලියන 10.54 ක ඇවර කිරීමේ අලාභ අතරින් රු. මිලියන 7.80 කට සමාන වටිනාකමක් පමණක් සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත්කරුට සිදු කළ ගෙවීම් වලින් අඩු කොට තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් වලින් අඩු කළ යුතු රු.මිලියන 2.74 ක ඉතිරි ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ලැබිය යුතු දෑ ලෙස හඳුනාගෙන නොතිබුණි. | 2.74 | එම දෝෂය පිළිගන්නා අතර 2021 වර්ෂයේ දී නිවැරදි කරන්නෙමු. | ලැබිය යුතු සහ ඇවර කිරීමේ අලාභ ශේෂය නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු යුතු වීම. |
| (ඉ) | සමාලොචිත වර්ෂය තුළ නිම කොට ජනතා අයිතියට පත් කරන ලද පිරිවැය වටිනාකම රු.මිලියන 116.92 ක් වන හොප්ටන් රේන්ද පොළ ව්‍යාපෘතිය සහ යාලගමුව ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධනිත ගත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. | 116.92 | මෙම ව්‍යාපෘතීන් භෞතිකව නිම කළ ද වර්ෂය අවසානයට අවසන් ගෙවීම් සිදු කර නොමැත. එම නිසා ඒ හේතුවෙන් එය කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇත්තෙමු. | නිම කරන ලද ජල සම්පාදන ව්‍යාපෘති වටිනාකම ප්‍රාග්ධනිත ගත කළ යුතු වීම. |

## 2.2 නොපියවූ ශේෂයන්

| අංකය | විස්තරය | මුදල | නොපියවූ කාල සීමාව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| ------- | ------------ | --------- | ------------- | ---------------------------- | -------------------------- |
| | | රු. මිලියන | | | |
| (අ) | සැපයුම්කරුවන්ට අත්තිකාරම් | 3.23 | වසර 3 වැඩි | 2021 වර්ෂය තුළ මෙම අත්තිකාරම් පියවීමට කටයුතු කරනු ලැබේ. | සැපයුම්කරුවන්ට ගෙවන ලද අත්තිකාරම් ප්‍රමාදයකින් තොරව අය කර ගත යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් (වැලිපොතයාය ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය) | 2.87 | වසර 2 වැඩි | රු. 2870,875 ක් 2021 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ගෙවූ අත්තිකරම් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට ක්‍රියා මාර්ග ගත යුතු වීම. |
| (ඇ) | කොන්ත්‍රාත් අත්තිකාරම් | 182.53 | වසර 3 වැඩි | 2021 වර්ෂය තුළ මෙම අත්තිකාරම් පියවීමට කටයුතු යොදනු ඇත. | ගෙවන ලද අත්තිකාරම් අයකර ගැනීමට පසු විපරම් ක්‍රියාමාර්ග ගතයුතු වීම හෝ අත්තිකාරම් සුරක්ෂණයන් අවශ්‍ය විට මුදල් කර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ඈ) | බාහිර ආයතන වල තබා ඇති කෙටි කාලීන තැන්පත් | 36.78 | වසර 3 වැඩි | මෙම වර්ෂය තුළ ඇතැම් ගෙවීම් නිදහස් කරනු ඇත. ව්‍යාපෘතිය අවසන්වීමට පෙර සියල්ලම නිදහස් කරනු ඇත. | කෙටිකාලීන තැන්පත් ප්‍රමාදයකින් තොරව අයකර ගත යුතු වීම. |

## 2.3 රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| රීති හා රෙගුලාසියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 170 (3) ඡේදය | සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකුගෙන් අඩු කර ගන්නා ලද රු. මිලියන 16.87 ක ඇවර කිරීමේ අලාභ 2021 අප්‍රේල් 30 දින වන වටත් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුගෙන් සැලකිය යුතු ඉල්ලීමක් ලද විට කොන්ත්‍රාත්තුව අඛණ්ඩව කරගෙන යාමට අප විසින් කාල දිගුවක් ලබා දෙන අතර ඒ හේතුවෙන් අඩු කර ගන්නා ලද ඇවර කිරීමේ අලාභ නිදහස් කිරීමට සිදුවේ. | මුදල් රෙගුලාසිවල ප්‍රතිපාදනයන්ට අනුගත විය යුතු වීම. |

3. භෞතික කාර්ය සාධනය

3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2020 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාද දින ගණන | ප්‍රමාද වීමට හේතු/ කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| ------------- | --------------- | ------------------- | | --------- | ------------- | -------------------- |
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | ළඟා කර ගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | | | |
| නාගරික, ග්‍රාමීය සහ වතු ජල සැපයුම් හා සනීපාරක්ෂක පහසුකම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමේ යෝජනා ක්‍රම | නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රම | | | | | |
| | පඹගින්න ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 70 | 489 | ජල පිරිපහදු මධ්‍යස්ථානයේ භූමි අලංකරණය යනාදී වැඩ කොටස් ඉතිරිව ඇති අතර ඒවා 2021 සැප්තැම්බර් වන විට නිම කළ හැකිය. | i) දී ඇති ඉලක්කගත දිනයන් තුළ කොන්ත්‍රාත් වැඩ නිම කිරීමට කළමනාකාරීත්වය පියවර ගත යුතු වීම. |
| | මුලතිව් ජල සම්පාදන ව්‍යාපෘතිය | 100 | 85 | 288 | මෙය 2021 මැයි මාසය මැද දී ජනතා අයිතියට පත්කර ඇත. ව්‍යාපෘතිය විසින් යම් සම්බන්ධතා ලබා දීමෙන් අනතුරුව 2021 ජූනි අවසන් වන විට මෙම යෝජනා ක්‍රමය භාර දෙනු ඇත. | ii) කොන්ත්‍රාත්කරුවන්ගේ පිළිගත නොහැකි හේතූන් සඳහා කාල දිගුවන් ලබා නොදිය යුතු වීම හා කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනයන් පවතින අවස්ථාවන්හිදී කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ඇවර කිරීමේ අලාභ අඩු කර ගත යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| මුලන්කාවිල් ජල සම්පාදන ව්‍යාපෘතිය | 100 | 65 | 326 | මෙම ව්‍යාපෘතිය 2021 සැප්තැම්බර් වන විට නිම කරනු ඇත. | iii) දුර්වල කාර්යසාධනයක් සහිත කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් ප්‍රදානය නොකල යුතු වීම. |
| **පුනරුත්ථාපන හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම** | | | | | |
| ලබුගම ජල සම්පාදන යෝජනා ක්‍රමය | 75 | 75 | 408 | මෙම ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් වන විට නිම කරනු ඇත. | |
| දිඹුලාන අනුබද්ධ (අදියර iv) ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 80 | 556 | මෙම ව්‍යාපෘතිය 2021 අගෝස්තු වන විට නිම කරනු ඇත. | |
| කොත්මලේ අනුබද්ධ පුනුරුත්ථාපන (අදියර iv) ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 98 | 426 | හතර වන ව්‍යාපෘතියේ දී ඉඩම් ගැටළුවක් මතු ව ඇති අතර එය මුළු යෝජනා ක්‍රමයේම ප්‍රමාදයට හේතු විය.කෙසේ වෙතත් ව්‍යාපෘතියේ වැඩ කරගෙන යන බැවින් එය 2021 අගෝස්තු වන විට නිම කළ හැකි වේ. | |
| දියතලාව ජල සම්පාදන ව්‍යාපෘති ඉදි කිරීම් යෝජනා ක්‍රමය | 100 | 30 | 573 | මෙම යෝජනා ක්‍රමය අවසන් කිරීමේ ක්‍රියාවලියේ පවතී. | |
| ලුණුගල නගර ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 85 | 594 | මාර්තු 30 වන දින අර්ධ වශයෙන් ජනතා අයිතියට පත් කළ අතර මාස දෙකක් තුළ දී අවසන් කරනු ලැබේ. | |
| ඔරුබැඳිවැව ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය (අදියර 1) | 100 | 84 | 230 | මෙම යෝජනා ක්‍රමයේ අදියර තුන අතරින් පළමු අදියර යටතේ 80% ක වැඩ | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | අවසන් කොට ඇති අතර 2021 අගෝස්තු අවසානය වන විට ජනතා අයිතියට පත් කරනු ඇත. |
| ඔරුබැඳිවැව ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය (අදියර 11) | 100 | 62 | 115 | 2021 අගෝස්තු අවසානය වන විට අදියර II ජනතා අයිතියට පත් කරනු ඇත.ඩීඅයි පයිප්ප ආනයනික ප්‍රමාදය සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය ප්‍රමාදයට හේතු විය. |
| බුලුවාන ජල සම්පාදන යෝජනා ක්‍රමය | 80 | 65 | 147 | තව මාස හයක කාල සීමාවකින් එය අවසන් වනු ඇත. |
| හකමූව ජල සම්පාදන යෝජනා ක්‍රමය | 80 | 55 | 210 | විදුලි බල සැපයුම ලබා ගැනීමේ ප්‍රමාදය, වැඩ බිමට පොම්ප සැපයීම සඳහා පැවති ආනයනික සීමාවන්, කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය මෙහි ප්‍රමාදයට හේතු විය. මාස හතරක් තුළදී වැඩ අවසන් කළ හැකි වේ. |
| දොඹගම්මන ග්‍රාමීය ජල සම්පාදන ඉදි කිරීම් යෝජනා ක්‍රමය | 90 | 75 | 253 | ප්‍රජාවගෙන් එල්ල වූ විරෝධතා හේතුවෙන් තුළු මුව ඉඩම සම්බන්ධයේන් ගැටළුවක් ඇති විය. |

| | | | | |
|---|---|---|---|---|
| ගීන්ගම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 75 | 820 | 2021 ජූලි අවසානයේ නිම කෙරෙනු ඇත. |
| බුලත්ගම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 95 | 80 | 59 | යෝජනා ක්‍රමය අවසන් වී ඇති අතර නිවාස සම්බන්ධතා ලබා දීම ක්‍රියාත්මක වෙමින් පවතී. |
| කොටඹේ ජල සම්පාදන ව්‍යාපෘතිය | 95 | 60 | 58 | මාස හතරක් තුළ දී වැඩ අවසන් කෙරෙනු ඇත. |
| හෝප් ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 45 | 334 | වැඩ අවසන් කිරීම සඳහා තවත් මාස හයක් අවශ්‍ය වේ. |
| බුලත්කොහුපිටිය ඒකාබද්ධ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 78 | 55 | 134 | 2021 සැප්තැම්බර් වන විට වැඩ අවසන් කළ හැකි වේ. |
| ග්‍රාමීය සංවර්ධනය සඳහා එක් මාවතක් ව්‍යාපෘතිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පයිප්ප හා උපාංග සැපයීම හා ඇතිරීම | 100 | 90 | 940 | මාර්ග ව්‍යාපෘතියක් ද ක්‍රියාත්මක වන බැවින් මෙය සංකීර්ණ ව්‍යාපෘතියක් වුව ද වැඩ අවසන් කොට ඇත. |
| තෙලිගම ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතියේ ඉතිරි වැඩ | 80 | 52 | 297 | ගල ඉවත් කිරීම සඳහා ගල පිපිරීම කල යුතුවේ. මාස තුනක් ඇතුළත නිම කෙරෙනු ඇත. |
| පල්ලෙපිටිය ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 57 | 681 | මෙම ජල සම්පාදන යෝජනා ක්‍රමය අවසන් කොට ඇත. |
| කුබුලුමුල්ල ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 50 | 43 | 122 | මෙම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වැඩ |
| පීල්ලෙකඳුර ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය | 100 | 60 | 1064 | 2021 අගෝස්තු අවසානයේ දී නිම කළ හැකි වේ. |
| පොන්නගර් පාතියපුරම් ජල සම්පාදන යෝජනා ක්‍රමය | 90 | 55 | 32 | මෙම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වැඩ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 2021 සැප්තැම්බර්හිදී නිම කළ හැකි වේ. |
| කල්මඩුනගර් ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 70 | 691 | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ප්‍රමාදයක් ඇති විය. 2021 අගෝස්තු මාසයේ දී වැඩ නිම කළ හැකිය. |
| ජෙයපුරම් ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 70 | 279 | |
| අයකාකච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 80 | 541 | |
| උලවනවාර් ජල සම්පාදන යෝජනා ක්‍රමය | 95 | 48 | 97 | 2021 අගෝස්තු හිදී වැඩ නිම කරනු ඇත. |
| කිලිනොච්චි නව ජල සම්පාදන යෝජනා ක්‍රමය (තුළුමුව) | 90 | 45 | 35 | සිවිල් වැඩ අවසන් කොට ඇත. මෙය 2021 දෙසැම්බර් හිදී නිම කරනු ඇත. |
| ග්‍රාමීය ජල සම්පාදනය සඳහා දිස්ත්‍රික් සහය සේවා මධ්‍යස්ථානය ඉදි කිරීම | 100 | 85 | 161 | අභ්‍යන්තර ලී බඩු සැපයුම ක්‍රියාත්මක වෙමින් පවතී. |
| තිරිමුරුක්කන්ඩි නව ජල සම්පාදන යෝජනා ක්‍රමය (තුළුමුව) | 100 | 55 | 484 | කාර්යසාධනය ඉතා දුර්වන හෙයින් මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව ඇත. |
| පුදුකුඩුඉරිප්පු ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 70 | 411 | ප්‍රධාන කාර්යයන් අවසන් කර ඇති අතර නිවාස සම්බන්ධතා ලබා දීම ක්‍රියාත්මක වෙමින් පවතී. |
| කියුබික් මීටර 25 ධාරිතාවයෙන් යුත් තලවකැලේ අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම | 100 | 70 | 69 | සිවිල් වැඩ අවසන් කොට ඇත. පොම්ප සවි කිරීම නිම කිරීමට අවශ්‍ය වේ. |
| මොණරාගල දිස්ත්‍රික්කයේ රතුගල සනීපාරක්ෂක වැසිකිළි ඉදි කිරීම | 100 | 30 | 141 | අඛණ්ඩ වර්ෂාව හේතුවෙන් වැඩ අත් හිටවූ අතර කඩිනමින් යලි ආරම්භ කරනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| එඩින්බර්ග් වතුයායේ වැසිකිළි ඉතිරි වැඩ ඉදිකිරීම | 100 | 70 | 252 | වැඩ කෙරීගෙන යයි. වර්ෂාව හේතුවෙන් අතරමග නවතා ඇත. |
| ග්ලැසෝ වතුයායේ වැසිකිළි ඉතිරි වැඩ ඉදිකිරීම | 100 | 10 | 85 | ප්‍රදේශයේ පැවති වර්ෂාව හේතුවෙන් වැඩ නවතා ඇත. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | රු. මිලියන 512.12 ක සංචලන අත්තිකාරම් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරුවන් අත රඳවා ගැනීමට ඉඩ හරිමින් ජල සම්පාදන ව්‍යාපෘති එකොළහක නිරතවී සිටි කොන්ත්‍රාත්කරුවන්ට මුල් කොන්ත්‍රාත් කාලයද ඉක්මවා යමින් එකම ව්‍යාපෘතිය සඳහා අවස්ථා දෙකේ සිට පහ දක්වා කාල දිගුවන් ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. | මෙම සියළු ජල සම්පාදන ව්‍යාපෘතීන්හි වැඩ 2021 වර්ෂයේ නිම වනු ඇති අතර අත්තිකාරම් අයකර ගනු ඇත. | (අ සිට ඒ දක්වා)<br>(i) ව්‍යාපෘතියේ ප්‍රගතිය දිස්ත්‍රික් කළමනාකරුවන් විසින් නියමිත කාල සීමාව තුළදී නිම කිරීම සඳහා අධීක්ෂණය කළ යුතු වීම.<br><br>(ii) කාල දිගුවන් ලබා දීම වෙනුවට දුර්වල කාර්ය සාධනයක් සහිත කොන්ත්‍රාත්කරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු අඩු කල යුතු වීම.<br>(iii) නියමිත වේලාවට වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරුට බලපෑම් කළ යුතු වීම.<br>(iv)අතහැර දැමූ ව්‍යාපෘති කඩිනමින් නැවත ප්‍රදානය කළ යුතු වීම.<br>(v) ව්‍යාපෘතිය ආරම්භයේදී ප්‍රමාණවත් ව්‍යාපෘති කාල සීමාව හඳුනා ගත යුතු වීම. |
| (ආ) | කිලිනොච්චිය, නුවර - එළිය, මොනරාගල සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්හි මිලියන 289.35 ක කොන්ත්‍රාත් වටිනාකමින් අප ජල ව්‍යාපෘති හතරක් (04) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ අතර මොනරාගල දිස්ත්‍රික්කයේ හැර ඉතිරි ඒවායේ වැඩ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානයේ දී නිම කල යුතුව පැවතුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් කාලය මාස 09 කට සීමා කෙරුණද මාස 20 ක කාලයක් සඳහා දීර්ඝ කිරීම් තුනක් ලබාගෙන තිබූ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ව්‍යාපෘතිය පමණක් සමාලෝචිත වර්ෂය අවසානයේ දී නිම කර තිබුණි. | විෂය පථය වෙනස් කිරීම හේතුවෙන් ප්‍රමාදයක් සිදුවී ඇති බවට එකඟ වෙමු. | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තලවකැලේ අප ජල පිරිපහදුව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව මාස 12 කින් අවසන් කිරීමට නියමිතව 2019 ඔක්තෝබර්හි දී ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට නියමිත නිම කිරීමේ කාලය අවසන් වුවද කොන්ත්‍රාත්කරුවන්ට තවදුරටත් කාල දිගුවන් ලබා දී නොතිබුණි. | මෙය අවසන් අදියරේ පවතින අතර 2021 අගෝස්තු මාසයේදී අවසන් කෙරේ. | (vi) සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ආරම්භ කළ යුතු වීම.<br><br>(vii) අවසන් කරන ලද කොන්ත්‍රාත් සඳහා කාර්ය සාධන බැඳුම්කර සහ අත්තිකාරම් සුරක්ෂණයන් නැවත කැඳවීමකින් තොරව කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව හැකි ඉක්මනින් මුදල් කර ගත යුතු වීම. |
| (ඈ) | රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල් හතරක සහ රෝහල් දෙකක සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් 2020 ඔක්තෝබර් 15 දින රු. මිලියන 25.5 ක් ලෙස පිරිනමා තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරු විසින් වැඩ ආරම්භ කරන අවස්ථාවේදී ඇන්දාන රෝහලේ සහ හුණුවල ධර්මරාජ විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු පිළිවෙලින් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පළාත් සභාව විසින් ඒ වන විටත් නිම කර තිබූ බව අනාවරණය විය.කෙසේ වෙතත්, කළමනාකරණයේ දුර්වල කොන්ත්‍රාත් පරිපාලනය හේතුවෙන් ඉහත ව්‍යාපෘති දෙකට අදාළ රු.1,618,394 ක අත්තිකාරමක් ද කොන්ත්‍රාත්කරුට නිදහස් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ නියමිත නිම කිරීමේ දිනය 2021 ජනවාරි 09 දින වුවද එක් සනීපාරක්ෂක කටයුත්තකට හෝ සම්බන්ධ ව්‍යාපෘති කටයුතු 2021 පෙබරවාරි 19 දින වන විටත් කොන්ත්‍රාත්කරු විසින් ආරම්භ කර නොතිබුණි. | ඇන්දාන රෝහලේ වැසිකිළි ඉදිකිරීම් කටයුතු විෂය පථයෙන් ඉවත් කරන ලදි. ධර්මරාජ විද්‍යාලයේ සනීපාරක්ෂක කටයුතු ඇතුළු අනෙකුත් වැඩ කටයුතු කරගෙන යමින් පවතී. කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් වැඩ ප්‍රමාද වී ඇත. | (viii) අදාළ බලධාරීන් සමඟ නිසි සම්බන්ධීකරණයකින් පසු (උදා: පාසල්) සහ සත්‍ය අවශ්‍යතාවය මත පදනම්ව අපේක්ෂිත ව්‍යාපෘතීන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු වීම. |
| (ඉ) | බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුබද්දන ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා රු.මිලියන 98.6 ක පිරිවැයකට පිරි නමා තිබූ කොන්ත්‍රාත්තුව 2019 පෙබරවාරි 13 දින වන විට අවසන් කිරීමට නියමිතව ඇත. අනතුරුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් වැඩ වලින් සියයට 52 ක් අවසන් කිරීමෙන් පසු කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, ඉතිරි වැඩ නිම කිරීමේ කොන්ත්‍රාත්තුවක් 2021 අප්‍රේල් 30 වන විටත් ප්‍රදානය කොට නොතිබුණි. | උඩුබද්දන යෝජනා ක්‍රමයේ කොන්ත්‍රාත්තුව අවසන් කර තිබූ අතර ඉතිරි වැඩ සඳහා ටෙන්ඩර් සකස් කරමින් පවතී. | |

| | | |
|---|---|---|
| (ඊ) | කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පොන්නගර් පතිපුරම් හි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා වූ පිරිවැය රු.මිලියන 216.93 ක සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව 2018 ඔක්තෝබර් 20 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. අනතුරුව වැඩ වලින් සියයට 36 ක් පමණක් අවසන්ව තිබියදී කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. තවද, 2020 නොවැම්බර් 28 දින අවසන් කිරීමට නියමිතව 2019 නොවැම්බර් 15 දින වෙනත් කොන්ත්රාත්කරුවකුට ඉතිරි වැඩ කටයුතු නිම කිරීමට ප්‍රදානය කර තිබුණි.කෙසේ වෙතත්, 2021 අප්‍රේල් 30 වන විටත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කොන්ත්‍රාත්කරු අසමත් ව තිබුණි. | වැඩ කටයුතු 2021 සැප්තැම්බර් මාසයේදී අවසන් කිරීමට සැලසුම් කර ඇත. |
| (උ) | බදුල්ල දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා 2018 මැයි 23 දින රු.මිලියන 337.44 ක පිරිවැයකට ලබා දුන් කොන්ත්‍රාත්තුව මාස 12 ක කාලයක් තුළදී අවසන් කිරීමට නියමිතව තිබූ අතර 2019 මැයි 06 දින මිලියන 57.65 ක සංචලන අත්තිකාරම් ගෙවීමෙන් පසුවත් කොන්ත්‍රාත්කරුට ලබා දී තිබූ ප්‍රතිග්‍රහණ ලිපියේ සිට දින 42 ක් ඇතුළත ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරු අසමත්ව තිබුණි. සංචලන අත්තිකාරම් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරු අත වසරකුත් මාස හයක් රඳවා ගැනීමට ඉඩ හරිමින් 2020 දෙසැම්බර් 31 දින වන විට යෝජනා ක්‍රමයේ භෞතික ප්‍රගතිය සියයට 30 ක් ලෙස පැවතුණි. තවද, කොන්ත්‍රාත්තුව අවසන් කර ඇති අතර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2020 ජනවාරි 31 දින කොන්ත්‍රාත්කරුගේ කාර්ය සාධන බැඳුම්කරය මුදල් කර ගැනීම සඳහා බැංකුවට එන්තර වාසි යවා තිබුණි. කෙසේ වෙතත්, කාර්ය සාධන බැඳුම්කරය හා අත්තිකාරම් සුරක්ෂණය මුදල් කර නොගෙන වලංගු කාලය මාස හතකට පසු රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් දීර්ඝ කරවා ගෙන තිබුණි. තවද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය සඳහා කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගෙන අත්තිකාරම් හා කාර්යසාධන | දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ව්‍යාපෘතිය මඟින් සමීපව අධීක්ෂණය කර ඇත. කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය තවදුරටත් පිරිහී ගියහොත් කොන්ත්‍රාත්තුව අවසන් කරනු ඇත. |

| | | |
|---|---|---|
| | සුරක්ෂණයන්හි වලංගු කාලසීමාව පිළිවෙලින් 2021 ජූලි 31 සහ 2022 ජනවාරි 31 දක්වා දීර්ඝ කර තිබුණි. | |
| (ඌ) | ව්‍යාපෘතියේ කාලසීමාව තුළ ඉහත සඳහන් දිස්ත්‍රික්ක 07 තුළ ඉදිකිරීමට නියමිතව තිබූ වැසිකිලි 20,878 න් වැසිකිළි 14,662 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට නිම කර තිබූ බව නිරීක්ෂණය විය. තවද, සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉදි කිරීමට නියමිතව තිබූ බදුල්ල දිස්ත්‍රික්කයේ වැසිකිළි 6,330 න් සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ වැසිකිළි 4,046 න් පිළිවෙලින් සියයට 67 ක් සහ සියයට 15 ක් නියෝජනය කරමින් බදුල්ලේ වැසිකිලි 4,284 ක් සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ වැසිකිලි 605 ක් සමාලෝචිත වර්ෂය අවසානයට නිම කර තිබුණි. | ප්‍රජාවන්ගේ දුර්වල ප්‍රතිචාරයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් දිස්ත්‍රික්කවල වැසිකිළි ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීමට අපට සිදු විය. |
| (එ) | ව්‍යාපෘතියේ මූලික සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ මුලතිව් දිස්ත්‍රික්කයේ වැලිඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විශේෂ අවශ්‍යතා ඇති ප්‍රතිලාභී සනීපාරක්ෂක ඒකකයක් ඉදි කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, එය 2021 අප්‍රේල් 30 වන විටත් ආරම්භ කර නොතිබුණි. | ලංසු සඳහා ලද දුර්වල ප්‍රතිචාරය මීට හේතු විය. |
| (ඒ) | ජල සම්පාදන අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව, බදුල්ල - හල්දුම්මුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය 2019 දී ආරම්භ කිරීමට නියමිතව තිබූ අතර ඒ සම්බන්ධයෙන් ඉඩම් අත්පත් කර ගැනීම, පාංශු පරීක්ෂා කිරීම සහ පර්යේෂණ කටයුතු ආදිය සඳහා රු.202,430 ක වන්දි මත පොළියක්ද සමග 2018 සහ 2019 වර්ෂයන් තුළ රු. මිලියන 7.06 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, 2021 අප්‍රේල් 30 වන විටත් කොන්ත්‍රාත්තුව පිරිනමා නොතිබුණි. | හල්දුම්මුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය අතිරේක මූල්‍යකරණය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතය. ප්‍රතිසංස්කරණය කරන ලද සැලසුම අවසන් කර ඇති අතර මුදල් ලද පසු ලංසු කැඳවනු ලැබේ. |

**3.3 වාරක පරීක්ෂණ නිරීක්ෂණ**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | **පඹහින්න නාගරික ජල සම්පාදන ව්‍යාපෘතිය** | | |
| (i) | ව්‍යාපෘතියේ කටයුතු 2017 සැප්තැම්බර් 13 දින ආරම්භ වූ අතර 2019 සැප්තැම්බර් 12 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය සහ මූල්‍ය නොහැකියාව හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 70 කට සීමා විය. තවද, කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අනුව කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද අලාභ සඳහා කිසිදු මුදලක් අඩු නොකර 2020 නොවැම්බර් 18 දින අවසන් වන පරිදි කොන්ත්‍රාත්කරුට දින 434 ක කාල දිගුවක් අවස්ථා හතරකදී ලබා දී තිබුණි.කෙසේ වෙතත්, 2021 පෙබරවාරි 15 දින වන විටත් කොන්ත්‍රාත්කරුට කිසිදු කාල දිගුවක් ලබා දී නොතිබුණි. | ඉතිරි වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු දක්වා දීර්ඝ කර ඇත. | (i) ව්‍යාපෘතියේ ප්‍රගතිය දිස්ත්‍රික් කළමනාකරුවන් විසින් නියමිත කාල සීමාව තුළදී නිම කිරීම සඳහා අධීක්ෂණය කළ යුතු වීම.<br>(ii) කාල දිගුවන් ලබා දීම වෙනුවට දුර්වල කාර්යසාධනයක් සහිත කොන්ත්‍රාත්කරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු අඩු කල යුතු වීම.<br>(iii) නියමිත වේලාවට වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරුට බලපෑම් කළ යුතු වීම.<br>(iv) ව්‍යාපෘතිය ආරම්භයේදී ප්‍රමාණවත් ව්‍යාපෘති කාල සීමාව හඳුනා ගත යුතු වීම. |
| (ii) | ප්‍රමාණ පත්‍ර අයිතමය 3.11 සහ 3.12 යටතේ රු.911,925 ක් වෙන් කර ඇතත් ඉදිකිරීම් කටයුතු සඳහා ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට තුළුමුව දක්වා ප්‍රවේශ මාර්ගය නිසි පරිදි ඉදිකර නොතිබුණි. | අධික වර්ෂාව හේතුවෙන් ප්‍රවේශ මාර්ගය සෝදා ගොස් ඇත. ස්ථිර මාර්ග ඉදිකිරීම් කටයුතු ටෙන්ඩරයට ඇතුළත් නොකලෙමු. | ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා තුළු මුව දක්වා වූ ප්‍රවේශ මාර්ගය නිසි පරිදි ඉදි කළ යුතු වීම. |
| (iii) | තුළු මුව හා මන්නවත්ත භූගත ජලාශයේ රැකබලා ගන්නන්ගේ නිවාස, මන්නවත්ත භූගත ජලාශයේ විදුලි ජනක යන්ත්‍ර කුටිය, යක්දෙහිවල භූගත ජලාශයේ මුරකරු නිවස ඉදි කිරීම 2021 පෙබරවාරි 15 වන විටත් නිම කර නොතිබුණි. | මෙම කාර්යයන් කෙරීගෙන යනු ලැබේ.. | ව්‍යාපෘතියේ ප්‍රගතිය දිස්ත්‍රික් කළමනාකරුවන් විසින් නියමිත කාල සීමාව තුළදී නිම කිරීම සඳහා අධීක්ෂණය කළ යුතු වීම. |
| (iv) | යක්දෙහිවල භූගත ජලාශයේ භෞතික පරීක්‍ෂණයේදී කාන්දුවීම් දෙකක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, කාන්දුවීම් නිවැරදි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | භාර දීමට පෙර කොන්ත්‍රාත්කරුට සියළු කාන්දු වීම් සම්පූර්ණ කිරීමට සිදුවේ. | ඉදිකිරීම් කාලයේදී ව්‍යාපෘති ඉංජිනේරුවන් විසින් සමීප අධීක්ෂණයක් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (v) | මීටර් 42,079 ක මුළු සම්ප්‍රේෂණ එළීම් වලින් මීටර් 33,659.7 ක් පමණක් 2021 පෙබරවාරි 21 දින වන විට සම්පූර්ණ කර තිබූ අතර පඹහින්න- බලංගොඩ මාර්ගය සහ පඹහින්න- බදුල්ල මාර්ගයේ එළීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | මෙම ඉතිරි නල එළීමේ කටයුතු සඳහා නව කොන්ත්‍රාත්තුවක් කැඳවා වැඩ ආරම්භ කර ඇත. | i) ව්‍යාපෘතියේ ප්‍රගතිය දිස්ත්‍රික් කළමනාකරුවන් විසින් නියමිත කාල සීමාව තුළදී නිම කිරීම සඳහා අධීක්ෂණය කළ යුතු වීම.<br>(ii) කාල දිගුවන් ලබා දීම වෙනුවට දුර්වල කාර්යසාධනයක් සහිත කොන්ත්‍රාත්කරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු අඩු කල යුතු වීම.<br>(iii) නියමිත වේලාවට වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරුට බලපෑම් කළ යුතු වීම. |
| (ආ) | ප්‍රජා මූල සංවිධාන 34 ක ජල මනු 10,000 ක් සවි කිරීමේ අරමුණින් නිවිතිගල ග්‍රාමීය පුනරුත්ථාපන ජල සම්පාදන යෝජනා ක්‍රමය එහි වැඩ කටයුතු 2018 සැප්තැම්බර් 12 දින ආරම්භ කර තිබූ අතර එය මාස පහක් ඇතුළත නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2021 පෙබරවාරි 19 දිනට නියමිත වැඩ නිම කිරීමේ දිනෙන් වසර 2 ක් අවසන් වුවද, ජල මනු 7608 ක් පමණක් සවි කර තිබුණි. | පුනරුත්ථාපන වැඩසටහන යටතේ ජල මනු සවි කිරීමට ප්‍රජා පාදක සංවිධානය උනන්දුවක් නොදැක්වීම හේතුවෙන් ජල මනු සවිකිරීම සම්පූර්ණ කළ නොහැකි විය. වැඩ අවසන් වූ විට කොන්ත්‍රාත්තුව අවසන් වේ. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර අවශ්‍යතා පැහැදිලිව හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘති ඇගයීම සහ ශක්‍යතා අධ්‍යයනය නිසි ලෙස සිදු කළ යුතු වීම. |

### 3.4 නිෂ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | පඹහින්න නාගරික ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා රු. 7,140,000 ක වියදමින් ආනයනය කරන ලද ජනක යන්ත්‍ර, මන්නවත්ත භූගත ජලාශ භූමියේ ජනක යන්ත්‍ර කුටිය ඉදි නොකිරීම හේතුවෙන් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. | කොන්ත්‍රාත්තුව අවසන් වීමට පෙර ජනක යන්ත්‍රය සවි කරනු ඇත. | කාර්යක්ෂම හා ඵලදායී ලෙස වත්කම් ප්‍රයෝජනයට ගැනීමට පියවර ගත යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ වාහන හතක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වැවිලි මානව සංවර්ධන භාරය සහ ජාතික ප්‍රජා ජල සැපයුම් ජල සම්පාදන දෙපාර්තමේන්තුවට නිදහස් කර තිබූ | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සංවිධානයන්හි ධාරිතා වර්ධනය යටතේ මෙම වාහන නිදහස් කර ඇත. | අදාළ ආයතන වලින් වාහන ලබා ගැනීම සඳහා පසු විපරම් පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අතර ඒ සඳහා රු. මිලියන 1.22 ක් වැය කර තිබුණි. | | |
| (ඇ) | ව්‍යාපෘතිය මගින් 2019 වර්ෂය තුළ රු.27,238,510 ක වියදමින් මිලදී ගත් ජංගම රසායනාගාරයක් වාහනයේ අයිතිය පැවරීමකින් තොරව 2019 අප්‍රේල් 10 දින ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. කෙසේ වෙතත්, සාම්පල එකතු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට දින 24 ක් තුළදී පමණක් එය භාවිතා කර තිබුණි. | හිමිකාරිත්වය මාරු කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. ජංගම විද්‍යාගාරය ඵලදායීව භාවිතා කිරීමට දෙපාර්තමේන්තුවට සිදු වේ. | ව්‍යාපෘතියේ අරමුදල් ඵලදායීව පරිහරණය කිරීම සහතික කිරීම සඳහා විධිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක් තිබිය යුතු වීම. |

**3.5 මතභේදාත්මක ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| බණ්ඩාරවෙල- තෙලිහවැව කුරුකුදේගම ජල යෝජනා ක්‍රමය සහ අන්දළුව පුනරුත්ථාපන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට එකතු වටිනාකම රු. 844,129 ක අසාමාන්‍ය බැර ශේෂයක් නිරීක්ෂණය විය. | එකඟ වන අතර මෙම වැඩිපුර අයකර ගත් වටිනාකම 2021 තක්සේරු වර්ෂයේදී පියවීමට අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ඇත. | අවසන් ගෙවීම් සහතික කිරීමට හා ගෙවීමට පෙර, කොන්ත්‍රාත් අත්තිකාරම් ගෙවීම් වැඩියෙන්/අඩුවෙන් අය නොකල බව සහතික කර ගත යුතු වීම. |

**3.6 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු**

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ කාර්ය මණ්ඩලය තනතුරු 27 කින් සමන්විත විය. එම පුරප්පාඩු 108 අතුරින් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, ඉංජිනේරු සහ සමාජවිද්‍යාඥ යනාදී ප්‍රධාන තනතුරු ඇතුළත්ව තනතුරු 16 ක් 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කිරීමකින් තොරව වසර 05 කට වඩා වැඩි කාලයක් පැවතුණි. තවද,2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන්ට පටහැනිව පිටස්තර ආයතනවල සේවකයින් | ඉඩම් නිලධාරියාගේ සේවය පරිත්‍යාගශීලියාගේ( ණය නියෝජිතයාගේ) අනිවාර්ය අවශ්‍යතාවයක් බැවින් ඔහුව බාහිරින් බඳවා ගත් අතර එම්එස්ඩී චක්‍ර ලේඛනයේ වැටුප් පියවරට සමාන වැටුපක් නියම කරන ලදී. කෙටුම්පත් ශිල්පී , ප්‍රමාණ සමීක්ෂක, වැඩබිම් අධීක්ෂක එම්එස්ඩී අනුමැතිය යටතේ ආවරණය නොවන හෙයින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සඳහා තාවකාලික පදනම මත සේවයේ යොදවා ඇත. | පුරප්පාඩු ප්‍රමාදයකින් තොරව පිරවීමටත් අනුමත නොකළ සේවකයින් බඳවා ගැනීමෙන් වැළකීමටත් කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | 136 දෙනෙකු ව්‍යාපෘතිය විසින් සේවයේ යොදවා තිබූ අතර එකතු වටිනාකම රු. මිලියන 71.83 ක වේතනයක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. ඉහත සේවකයින් අතුරින් සේවකයින් 27 දෙනෙකු ප්‍රමාණ සමීක්ෂක**,** කෙටුම්පත් ශිල්පී **,** ඉඩම් නිලධාරී, වැඩබිම් අධීක්ෂක යනාදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකරන ලද තනතුරු 08 ක් සඳහා සේවයේ යොදවා තිබුණි. | | |
| (ආ) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් 2015 ඔක්තෝබර් 26 දින පූර්ණ කාලීනව ව්‍යාපෘතියට මුදා හරින ලද ව්‍යාපෘති අධ්‍යක්ෂ, 2020 නොවැම්බර් 05 දින සිට බලපැවැත්වෙන පරිදි ජාතික ජල සම්පාදන ජලාපවහන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර උතුර) ලෙස උසස් කර තිබුණි. එබැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 දරන හා 2019 මාර්තු 05 දිනති චක්‍ර ලේඛනයේ 2.3.2 වගන්තිය අනුව ඔහුගේ සේවය පූර්ණ කාලීනව සිදු නොකෙරේ. | අමාත්‍යාංශය / ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට නව ව්‍යාපෘති අධ්‍යක්‍ෂවරයෙකු පත් කිරීමට සිදුවේ. | පූර්ණ කාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට කටයුතු කළ යුතු වීම. |